# අනුරාධපුර යුගයේ සමාජය සමඟ සම්බන්ධ වූ ශාක වර්ග පිළිබඳව වංසකථා ඇසුරින් විමර්ශනය

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***අයි. කේ. එන්. එස්. බුද්ධදාස[1]***

සංක්ෂේපය

ආදි මානවයාගේ අවදියේ පටන් ම මානව සමාජය පරිසරය සමඟ ඒකාබද්ධව ගොඩනැගෙමින් පැවතුණි. ශාක යනු පරිසර පද්ධතියේ ප්‍රධාන අංගයක් වන අතර එම ශාක කාලානුරූපීව පරිණාමය වේ. මේ අනුව වංසකථා විමර්ශනය ඇසුරින් අතීතයේදී මෙරට සමාජය සමඟ පරිසර පද්ධතියේ වූ ශාක සම්බන්ධ වූ ආකාරය අධ්‍යයනය කළ හැකි ය.

අනුරාධපුර රාජධානිය තුළ පැවති සමාජය සමඟ සම්බන්ධ වූ ශාක වර්ග පිළිබඳව මේ වන විට සිදු කෙරී ඇති පර්යේෂණ ප්‍රමාණය ඉතාමත් අල්ප වීම හේතු කොටගෙන එම යුගයේ පැවති ශාක පිළිබඳව විමර්ශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ විය. එමෙන් ම එහිදී අතීතයේ පැවති ශාක වර්තමානයේ සමාජය හඳුනාගන්නා ආකාරය හා සමාජගත වන ආකාරය අධ්‍යයනය කිරීම ද අරමුණ විය.

ඒ අනුව ඉහත අරමුණු ඉටුකර ගැනීම උදෙසා ලංකාවේ ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය පදනම් කර ගෙන අනුරාධපුර යුගයේ පැවති ශාක වර්ග විමර්ශනය කිරීම මෙහිදී සිදු විය. මෙම පර්යේෂණය සාර්ථක කර ගැනීම උදෙසා ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය පරිහරණය කිරීමේදී දීපවංසය, මහාවංසය ථූපවංසය ආදී වූ වංසකථා ගණයෙහි ලා සලකන ග්‍රන්ථ කිහිපය ප්‍රධාන වශයෙන් මුල් කර ගැනුණි. එහෙත් එම සාධකවල විශ්වසනීයත්වය තහවුරු කර ගැනීම උදෙසා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයක් වන සෙල්ලිපි ද උපකාර කර ගැනුණි. මෙම ප්‍රාථමික මූලාශ්‍රය ඇසුරින් ගොඩනගා ගත් තොරතුරු පෝෂණය කර ගැනීම උදෙසා ද්විතියික සාහිත්‍ය මූලාශ්‍රය ද උපකාරී විය. එමෙන් ම ශාක සමඟ නිතර කටයුතු කරන ඒවා පිළිබඳව පුළුල් අවබෝධයක් ඇති ගැමි ජනයාගේ අදහස් ද මෙම පර්යේෂණය සාර්ථක කරගැනීමට උපකාරී වි ය.

මෙලෙස සිදු කෙරුණ පර්යේෂණයේදී අනුරාධපුර යුගයේ සමාජය සමඟ සම්බන්ධ වූ ශාක අසූවකට ආසන්න ප්‍රමාණයක් ගොනුකර ගැනීමට හැකි වූ අතර යම් යම් ශාක ජනයා විසින් උපයෝගී කරගත් ආකාරය ද හඳුනාගැනීමට හැකි විය. මේ අනුව වංසකථා ඇසුරින් සිදු කරන ලද විමර්ශනය මඟින් අනුරාධපුර යුගයේ සමාජය සමඟ සම්බන්ධ වූ ශාක වර්ග පිළිබඳ ව තොරතුරු රාශියක් ගොනු කර ගත හැකි විය.

මුඛ්‍ය පද - ශාක, මූලාශ්‍ර, සමාජය, අනුරාධපුර යුගය, සෙල්ලිපි

1.ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය